සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

01. ශිෂ්‍යයෝ එම සිංහල ප්‍රශ්න පත්‍රයට **කජු කන්නා** සේ පිළිතුරු සැපයූ බව පැවසූහ.
(1) ඉක්මනින් ම (2) සම්පූර්ණයෙන් (3) නිහඬ ව (4) ඉතා පහසුවෙන්

02. නව උසස් තනතුරු ලැබීමෙන් බොහෝ දෙනෙකුගේ **ඔළුව ඉදිමී** ඇති බව සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත.
(1) අහංකාර වීම (2) අසනීප වීම (3) බලවත් වීම (4) දුර්වල වීම

03. දියණිය විසින් කරන ලද වරද පාපොච්චාරණය කිරීම නිසා පියාගේ **පටි කැඩුණි.**
(1) අහංකාරය බිඳුණි. (2) වරද හෙළිවුණි. (3) ගෞරවය කෙලෙසුණි. (4) දුබල බව පෙනුණි.

04. පසිඳු සහ ජයසංඛ කුඩා අවධියේ සිට **පණට පණ මෙන්** සිටි යහළුවන් දෙදෙනෙකි.
(1) අමනාපයෙන් (2) සහයෝගයෙන් (3) ඉතා හිතවත්ව (4) ඉතා ළං ව

- **අංක 05 සිට 08 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

05. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ නිර්මාණ කෞශල්‍යය හා ...................... කවීත්වය සැළලිහිණි සන්දේශයෙන් ඉස්මතු වේ.
(1) අංගසම්පූර්ණ (2) ප්‍රතිභාපූර්ණ (3) අර්ථපූර්ණ (4) භාවපූර්ණ

06. ශ්‍රී ලංකාවේ ප්‍රාග් බෞද්ධ යුගයේ සිට මේ දක්වා ...................... වූ ගොඩනැගිලි ඉදිකිරීමේ ශිල්පයක් හඳුනා ගත හැකි ය.
(1) විකාසනය (2) විනාශය (3) ක්‍රියාත්මක (4) විමර්ෂණය

07. නාට්‍යෝචිත අවස්ථාවක් යනු ප්‍රේක්ෂකයාගේ සිතේ කුතුහලය හා ...................... උපරිමයෙන් කුළුගැන්විය හැකි අවස්ථා ය.
(1) ආනතිය (2) භාවිතය (3) අභිනය (4) ආතතිය

08. තමා ඇසූ දුටු දෙයක් හෝ සිතෙහි පහළ වූ දෙයක් හෝ භාෂාව භාවිත කරමින් පෙර නො ඇසූ නො කී ආකාරයෙන් පැවසීමට හැකියාව ලබන්නේ කවියා සතු ...................... හේතුවෙනි.
(1) ප්‍රතිභාව (2) සතතාභ්‍යාසය (3) පරිකල්පන ශක්තිය (4) බහුශ්‍රැතභාවය

- **අංක 09 සිට 10 තෙක් ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

09. (1) චණ්ඩ, ප්‍රාණ, මැතිණි, ප්‍රශ්ණ
(2) මැතිඥාණ, වැටුන, උෂ්ණ, සණ්ටාර
(3) ධාරාණිපාත, විමර්ශණ, ආසන්න, ගණිත
(4) මැතිවරණ, බැලුණු, ප්‍රවණතා, ඉන්න

10. (1) පිලිසඳර, විචාල, කළාල, කුඹල් (2) සියළු, තුළාව, ගෙවල, ළදරු
(3) ඇතුළත, මහලු, මළුව, සිසුකැල (4) සැළකිල්ල, පහළ, කසළ, මනාළිය

11. මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නො යෙදුණු වචනය සහිත වරණය තෝරන්න.

| | | |
|---|---|---|
| (1) සඤ්ඤක | : | දඟරය, ලඹය, හොඬ, ළිඳ |
| (2) අල්පප්‍රාණ | : | බද්ද, ජගතා, කට්ට, පත්‍ර |
| (3) මහාප්‍රාණ | : | ඛනිජ, ජොෂ්ඨ, මූර්ධජ, ප්‍රතිඵල |
| (4) ඌෂ්මාක්ෂර | : | ශක්තිය, ලේඛන, ෆාතිමා, ප්‍රහර්ෂය |

12. ඇලපිල්ල, කෙටි ඇදය, කෙටි පාපිල්ල, රකාරාංශය පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) පාසල, කුහරය, වැඩ, ක්‍රමය (2) නාරද, පැනය, ප්‍රගමනය, දුවන
(3) දාරය, කුමන, ළැම, ප්‍රථම (4) මාලය, ගැටය, රුවන, ද්‍රව්‍ය

13. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
(1) ඉඳුවරී, ගිහාන්, දසුනි, සංඛ (2) සාමක, නිම්සර, දිනෙත්, ඕෂධ
(3) චාරුනි, සිදත්, උමායා, නිපුණ (4) ජනිත්, වරුණ, සුපුන්, පැතුම්

14. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) නෙළුම් පියුම්, තඹරු, පංකජ, සියපත් (2) අනංග මල්සර, මීන්දද, වියොවග, මදන
(3) ඇස් ලෝචන, නේත්‍ර, අක්ෂි, නයන (4) ස්ත්‍රිය මාගම, ජනනී, ලලන, විලාසිනි

15. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක්** දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මධුර මියුරු, ප්‍රණීත, කන්කලු, මාධූර්යය (2) මහත් විපුල, තුමුල, නැබළ, විසල්
(3) අධම අවමාන, නිගරු, උත්තම, පරිභව (4) පර අන්‍ය, මෙරමා, අනුන්, අනෙක්

16. 'දෑස <u>නිලුපුල්</u> තෙමා කඳුළු මුතුවැල් සලා.....' ඉරි ඇඳි පදයෙහි සන්ධි නාමය වන්නේ,
(1) ස්වරාදේශ සන්ධියයි. (2) ගාත්‍රාදේශ සන්ධියයි.
(3) ද්විත්ව රූප සන්ධියයි. (4) ස්වර සන්ධියයි.

17. සන්ධි පද නිවැරදි ව විසන්ධි කර ඇති වරණය තෝරන්න.
(1) වත් + හල, සත් + නස, සිත් + තරු, ගෙත් + තම්
(2) මහ + ඉසුරු, වට + උර, දෙ + අවුරුදු, ඒ + අත
(3) දකුණ + අත, සුර + ඉඳු, නළ + අඟන, ගෙන් + ආවා
(4) පිළි + උතුරු, සුර + අඟන, මිණි + බරණ, මුනි + තුමා

18. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අප ආවේ පාසල් ගොසින් ය. (2) හේ තාලයට පාද තබමින් නටයි.
(3) කුකුළන් හඬලද්දී මම අවදි වූයෙමි. (4) අඳුර එතොත් සඳ බැබළෙයි.

19. ''ඇත්, ගිනි කඳක් සේ කිපි කිපී බුදුන් කරා දිවනුවේ කුමරහු දැක ඔහු කරා දිවී ය.'' මෙහි උපමානය වන්නේ,
(1) 'ඇත්' ය. (2) 'කුමරහු' ය. (3) 'ගිනි කඳක්' ය. (4) 'බුදුන් කරා' ය.

20. ''<u>කන්සෙට</u> පාරක් දෙමැයි කියන්නී''ඉරි ඇඳ පදයේ අර්ථය වන්නේ,
(1) මුහුණට ය. (2) කම්මුලට ය. (3) ඔළුවට ය. (4) මුබයට ය.

21. සිංහල ශබ්ද කෝෂයට අනුව 'කල්මී' යනු,
(1) තල් කිරි ය. (2) මී කිරි ය. (3) මිහිකත ය. (4) කාන්තාව ය.

22. පද දෙකෙහි අර්ථය සමාන යුගල පද තෝරන්න.
(1) බාල මහලු (2) කනකර (3) ඉඩම්කඩම් (4) වාදභේද

23. 'පහතින් දක්වා ඇති බව' දැක්වීමට යොදන විරාම ලක්ෂණයෙහි නාමය තෝරන්න.
(1) වරහන (2) කාක පාදය (3) තිත් පෙළ (4) තරු ලකුණ

24. විරාම ලක්ෂණ නිවැරදි ව යොදා ඇති වරණය තෝරන්න.

(1) ''මමයි හැදුවෙ, ඒ හින්ද මගෙයි දරුව.''

(2) ''මමයි හැදුවෙ! ඒ හින්ද මගෙයි දරුව!''

(3) ''මමයි හැදුවෙ. ඒ හින්ද මගෙයි දරුව!''

(4) ''මමයි හැදුවෙ! ඒ හින්ද මගෙයි දරුව.''

25. අන්තඃස්ථාක්ෂරයක් නොයෙදුණු පදයක් සහිත වරණය තෝරන්න.

(1) රංචුව, යතුර, ඔරුව, ලංකාව
(2) යගුලිය, බලය, සුළඟ, පැරණි
(3) වංචාව, කිරණ, නිලඹර, සංවාදය
(4) තණ්හාව, වර්ධනය, කාලය, රශ්මිය

26. ඉක්බිති, වැඩුණු, දුදන, සංස්කෘතික යන පදවල අනුපිළිවෙලින් ව්‍යාකරණ විධි දක්වා ඇති වරණය තෝරන්න.

(1) නිපාත, කෘදන්ත, උපසර්ග, තද්ධිත
(2) කෘදන්ත, නිපාත, උපසර්ග, තද්ධිත
(3) තද්ධිත, කෘදන්ත, නිපාත, උපසර්ග
(4) උපසර්ග, නිපාත, තද්ධිත, කෘදන්ත

27. 'ගුරුවරයකු' යන පදයේ ස්ත්‍රී ලිංග උක්ත රූපය සහිත වරණය තෝරන්න.

(1) ගුරුවරියක්
(2) ගුරුවරියක
(3) ගුරුවරිය
(4) ගුරුවරියන්

28. පහත සඳහන් වියරණ රීති අතුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සන්ධි වන පද දෙකෙන් පසු පදයේ මුල ඇති ස්වරය ලොප් කිරීමෙන් පරස්වර ලෝප සන්ධිය සකස් වේ.

(2) සන්ධි වන්නා වූ ශබ්ද දෙකක් අතරට අමුතුවෙන් ම අකුරක් පැමිණ පද ගැලපීමෙන් ආගම සන්ධිය සකස් වේ.

(3) පද දෙකකට මුල් පදයේ අග ඇති ව්‍යඤ්ජනාක්ෂරය පසු පදයේ මුල ඇති ස්වරය සමඟ එක්වීමෙන් ස්වර සන්ධිය සකස් වේ.

(4) පෙර පදයේ අග ඇති හල් අකුර දෙකක් බවට පත් කිරීමෙන් ද්විත්ව රූප සන්ධිය සකස් වේ.

- **අංක 29 හා 30 ප්‍රශ්නවල දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තා පිරුළ සහිත වරණය තෝරන්න.**

29. කිසිවිටෙක සිදුවිය නොහැකි දෙයක් සිදුවීම.

(1) මෝල්ගස් ගිල්ලා වගේ
(2) ඉහේ මලක් පිපුණා වගේ
(3) අත්තික්කා ගහේ මල් පිපුණා වගේ
(4) කටින් බතල සිටුවනවා වගේ

30. වැසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම.

(1) දී කිරට බළල්ලුන් සාක්කි වූ
(2) කලකදී වහලු කලකදී රස වෙනවා වූ
(3) උඩින් මිතුරු යටින් හතුරු
(4) කිරි එරෙන්නේ අඬන විට වූ

31. ර්යෝහෙයි, බුරම්පි සීයා, පූජක, රොබට් නොක්ස් යන චරිත, නාම ඇතුළත් පාඩම් අනුපිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) මේ අපේ උදාර වූ මාතෘ භූමිය යි, ළඳේ නිසරු නොකරන් අප සියලා, ආපදා කළමනාකරණය, තොරොක්කෝව

(2) මේ අපේ උදාර වූ මාතෘ භූමිය යි, තොරොක්කෝව, ළඳේ නිසරු නොකරන් අප සියලා, ආපදා කළමනාකරණය

(3) තොරොක්කෝව, ආපදා කළමනාකරණය, ළඳේ නිසරු නොකරන් අප සියලා, මේ අපේ උදාර වූ මාතෘ භූමියයි

(4) තොරොක්කෝව, මේ අපේ උදාර වූ මාතෘ භූමිය යි, ළඳේ නිසරු නොකරන් අප සියලා, ආපදා කළමනාකරණය

32. කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරක වාක්‍යයක් බවට පත් කිරීමේ දී අනුගමනය **නොකළ යුතු** ක්‍රියාමාර්ගයක් සහිත වරණය තෝරන්න.
   (1) උක්ත කර්තෘ අනුක්ත කිරීම
   (2) අනුක්ත කර්තෘට පසුව 'විසින්' නිපාතය යෙදීම
   (3) අනුක්ත කර්මය උක්ත කිරීම
   (4) අනුක්ත කර්තෘට ගැළපෙන ක්‍රියා පදයක් යෙදීම

33. මොනරාගල වැසියන් 'ලේලිය' හැඳින්වීමට භාවිත කරන පදය ඇතුළත් වරණය තෝරන්න.
   (1) පුතා දූ (2) දූ පුතා (3) මය් දූ (4) මා පුතා

34. ඇතැම් ප්‍රදේශවල 'හීන් අත්තා' යනුවෙන් හඳුන්වන්නේ,
   (1) අත්තා ය. (2) මහප්පා ය. (3) නැන්දා ය. (4) ආච්චී ය.

- **අංක 35 සිට 39 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

35. (1) අමුත්තෝ ගෙට එද්දී මම පොතක් බලමින් සිටියෙමි.
   (2) පෙර අපර දෙදිග ම ඔහුගේ නාමය පතළ වූහ.
   (3) ගුරුතුමා ළමයි ලවා පාඩම් කරවයි.
   (4) සිසුහු ජය ලබත්වා !

36. (1) සිරකරුවෝ දෙදෙනෙකු පැන ගියහ.
   (2) දරුවන් පාඩම් කරති'යි දෙමව්පියෝ සිතති.
   (3) පදිකයෝ කහ ඉරෙන් පාර මාරු විය යුතු ය.
   (4) මම ඒ පොත කියවා නැත.

37. (1) මම නොහොත් පියා නගරයට යයි.
   (2) ගංගා තොමෝ නිසල ව ඇදී යති.
   (3) මේ ගෙදර මිනිසුන් කොයි ද?
   (4) නිලධාරීහු එය වටහා ගැනීම වටී.

38. (1) රටේ නායකයන් අපි ද?
   (2) ගුරුවරු සිසු දරුවන්ට අකුරු උගන්වා වි.
   (3) මිනිසුන් නොමඟ යන්නේ ඇයි?
   (4) ගුරුතුමිය ළමයි කැටුව ප්‍රදර්ශනය නැරඹීමට ගියාය.

39. (1) ලිපිකරුවෙකු වූ ඔහු ගී ගැයීමෙහි දක්ෂයෙක් ද විය.
   (2) විචාරකයෝ විසින් ගත්කරුවන් පැසසුම් ලබති.
   (3) දරුවෝ මහ මග සෙල්ලම් කරනවා මම දුටුවෙමි.
   (4) දුව සුරඟනක් මෙන් සැරසුණාය.

- **පහත දැක්වෙන පද්‍ය කොටසෙහි වඩා නිවැරදි අර්ථය සහිත වරණය තෝරන්න.**

40. 'ඒවා සත්හු වෙණ නද අසමානය
   සමා නොවෙති කොවුලෝ උපමානය'
   (1) මහ සත්හුගේ ඒ අසමාන වෙණ නදට උපමා කිරීමට කොවුලෝ සුදුසු නොවෙති.
   (2) කොවුලන්ට උපමා කිරීමට මහසත්හුගේ වෙණ නද සුදුසු නොවෙති.
   (3) කොවුලෝ මහසත්හුගේ අසමාන වෙණ නදට සමාව ගැනීමට සුදුසු නොවෙති.
   (4) කොවුලන්ගේ ඒ අසමාන වෙණ නදට උපමා කිරීමට මහසත්හු සුදුසු නොවෙති.

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- **(i)** සිට **(x)** තෙක් ඇති සියලුම අනු කොටස්වලට පිළිතුරු ලියන්න. නොලියන කොටස් ඇත්නම් අංකය ලියා ඉරක් ගසන්න.

(01) (i) පහත සඳහන් අක්ෂර යෙදෙන වචනය බැගින් ලියා දක්වන්න.
(අ) ඬ (ආ) ඝ

(ii) පහත සඳහන් පදවල ප්‍රකෘති ප්‍රත්‍ය වෙන්කර ලියන්න.
(අ) අහසෙහි (ආ) දරුවා

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සැකසීම සඳහා කලමණාකරණ මණ්ඩලය තීරණ ගෙන තිබේ.

(iv) පහත සඳහන් පදවල අරුත් පැහැදිළිවන සේ වචන යොදා වාක්‍ය දෙකක් ලියා දක්වන්න.
එක් එක් කවියාගේ ප්‍රතිභා සක්තිය අනුව වර්ණනා විවිධ වේ.
(අ) පැල (ආ) පැළ

(v) පහත වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත්වන ක්‍රියාපද වර්ගය දක්වන්න.
(අ) කැලේ තියෙන කොයි දේවත් **රසවේවා**.
(ආ) **වදිමින්** සවස නළ හැසිරෙන දිගතුවල

(vi) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) ජාතිකෝත්සව (ආ) සුළැඟිල්ල

(vii) පහත වාක්‍යයෙහි එන උපමානය හා උපමේය ලියා දක්වන්න.
'මගෙ සුරතල් අක්කාගේ මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බිංදුයි හඳමු එකක් ඒ වාගේ

(viii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) සේවකයෝ මාර්ගය පිළිසකර කරති.
(ආ) කිරිල්ලියක් පැටවෙකු පෝෂණය කළාය.

(ix) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.
(අ) පයින් යන්නෝ දකුණින් ගමන් කළ යුතුය.
(ආ) සභා තොමෝ සතුටින් විසිර ගියහ.

(x) පහත වාක්‍යයෙහි එන නිපාත පදයක් හා උපසර්ග පදයක් උපුටා දක්වන්න.
දරුවන් කෙරෙහි ඇතිවන ඉමහත් ආදරය නිසා දෙමාපියෝ සිය ජීවිතය ම දරුවන් වෙනුවෙන් කැප කරති.
(අ) නිපාත (ආ) උපසර්ග

(ලකුණු 2 x 10 = 20)

02 පහත සඳහන් අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරින් **එකක්** තෝරාගෙන වචන 250 ට නොඅඩු රචනයක් සුදුසු මාතෘකාවක් යොදා ලියන්න.

(අ) රටක දියුණුවට රටවැසියන්ගේ දායකත්වය අවශ්‍ය වේ. දියුණුවට දායක වන්නන්ට ඒ සඳහා නිසි කායික මානසික ශක්තියක් අවශ්‍ය වේ. එබැවින් රටවැසියන්ගේ සෞඛ්‍යය රටකට වඩාත් වැදගත්ය. රටක සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා රෝගවලට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සැම රටකට ම සිදුවේ. එබැවින් රෝගවලට පිළියම් යෙදීම මෙන් ම රෝගී වීමට පෙර එයින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව ද වර්තමානයේ ඉස්මතු වී පෙනේ.

(ආ) ළමුන් යනු රටක අනාගතයයි. ලෝකයේ ම අවධානය ළමුන් වෙත කොතරම් යොමු වී තිබේද යත් අදවන විට ළමුන් උදෙසා අන්තර්ජාතික ප්‍රතිපත්ති පවා සැකසී තිබේ. නමුත් වත්මන් සමාජය තුළ ද ළමා

ශ්‍රමිකයන් දැක ගත හැකිය. අනෙක් අතට අපචාර, අපයෝජනවලට ලක්වීම නිසා ළමුන් ගේ අයිතිවාසිකම් කඩවීම පිළිබඳ තොරතුරු නිරන්තරයෙන් වාර්තා වෙයි. එබැවින් ළමා ලෝකය රැකගැනීමට අවශ්‍ය පියවර ගැනීම යුගයේ අවශ්‍යතාවයකි.

(ඉ) සොබාදහම මිනිසාට ජීවය සපයයි. සොබාදහමින් මානවයා ලබාගන්නා ප්‍රයෝජන මෙතෙකැයි කියා නිමකළ නොහැක. නමුත් වර්තමානයේ සොබාදහමෙහි විනාශය මිනිසා අතින්ම සිදුවෙයි. මිනිසා සොබාදහමෙන් ලද දායාද වර්තමානය වනවිට ක්ෂය වෙමින් පවතී. මේ නිසා අනාගතයෙහි මිනිස් සමාජය තුළ ස්වභාවික සම්පත් උදෙසා තරඟ කිරීමට මිනිසා පෙළඹිය හැකිය. එබැවින් සොබාදහම ගැන දෙවරක් සිතා බැලීම සිදුවිය යුතුව ඇත.

(ඊ) පිට්ටනිය වටා සෑම බිම් අඟලකම නරඹන්නෝ පිරී සිටියහ. තරගය ආරම්භ කිරීමට සියල්ල සූදානම් ය. සැමගේ ම ඇස් යොමු වී තිබෙන්නේ තරගයට ඉදිරිපත් වන අප දෙසය. සෑම දෙසින් ම ඇසෙන්නේ දිරිමත් කිරීමට නගන ජය ඝෝෂාය. මගේ දෙපා අප්‍රාණික වන්නේදැයි මට බියක් දැනේ. මගේ හදවත ගැහෙන හඬ පවා මට දැනෙයි. ඉන් අනතුරුව......

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය කියවා වචන 45 50 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාවද සාරාංශයෙහි අග ලියන්න.

ලංකාවෙහි ලිඛිත සාහිත්‍යයක් බිහි වීමට බුදු සමය මහත් අනුබලයක් විය. බුදු සමය ගෙන ඒමට පෙර ද මෙරට ජනාවාස පැවති නමුත් නිර්මාණාත්මක සාහිත්‍ය කටයුතු පැවති බවට සාධක නැත. බුදු සමය ලංකාවට හඳුන්වා දෙන ලද්දේ ඉන්දියාවේ මෞර්ය සංස්කෘතියේ උපරිම දියුණුවක් පැවති වකවානුවක, මෞර්යයන්ගේ ආගමික ප්‍රචාරක කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙනි. බෞද්ධාගම අන්තර්ජාතික ආගමක් කිරීමට දිරිගත් අශෝක අධිරාජ්‍යයා ඒ සමඟ ම මෞර්ය සංස්කෘතියේ අංග ද පැතිර යාමට ඉඩ සැලසීය. බුද්ධාගම ලංකාවේ පැතිර යාම සමඟ ම ඒ සංස්කෘතිකාංග ද මෙහි පැතිර ගියේය. බුදු සමයේ සම්ප්‍රාප්තියත් සමඟ විවිධ සාමාජීය හා ආගමික ආයතන මෙන් ම ගෘහ නිර්මාණ, මූර්ති, චිත්‍ර ආදී ශිල්ප ද ලේඛන කලාව වැනි කලා ද ඉක්මනින් දියුණු විය. මෙහි ලා විශේෂයෙන් වැදගත් වන්නේ මේ සංස්කෘතික අංග මූලික දර්ශනයක් හා අනිවාර්යයෙන් බැඳුණු උපාංග වීමයි. මේ ඒකාබද්ධතාව නිසා සාහිත්‍යය ඇතුළු ඒ සංස්කෘතිකාංග දිගු කල් තහවුරු ව පවත්නා ස්වරූපයක් ගත්තේය.

(ලකුණු 10)

04 පහත කවිපෙළ කියවා අසාඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උණුසුම දැනේ දහවල මට රැයට වඩා
වෙනසක් හෙම තියෙනවද මෙහි මෙයට වඩා
මට නොදැනෙන්නෙ මම කණ කොළුවෙකුලු කුඩා
ලොකු වෙනකොට දැනේවිද මම අසමි අඬා

ඇඟිලි තුඩට මල් පෙතිවල ඇති මෙලෙක
මට දැනෙනවා එය අල්ලන හැම විටෙක
'පාට' කියා ඇත්නම් ගතියක් මල ක
අම්මේ අත නොගෑවෙන එක තමයි දුක

'ලස්සන' කියන දේ නැහැයට වත් කණට
මගේ දිවට හරි මගෙ අතපය වලට
නොදැනෙන්නේ මොකද තෝරා දෙන කලට
ඉවසාගෙන ඉන්ට අම්මේ බැරිය මට

ඇයි අම්මේ අඬන්නේ මේ කඳුළු හෙළා
මට දැනෙනවා යයි මගෙ අත දිගට ගලා
නාඩන් අම්මෙ නාඩන් මම විහිළු කළා
එන්නට ගොසින් බොරු කී කොල්ලන්ට තලා

(1) මෙම පද්‍ය පන්තියේ කියැවෙන දරුවාගේ විශේෂත්වය කුමක් ද?
(2) මෙහි දැක්වෙන දරුවා නගන ප්‍රශ්න දෙකක් දක්වන්න.
(3) මෙහි එන මව හඬන්නේ කවර කරුණක් නිසාද?
(4) මෙහි එන දරුවා රැයෙහි හා දහවලෙහි වෙනස හඳුනා ගන්නේ කුමකින් ද?
(5) පහත සඳහන් පදවලට සමාන පදය බැගින් ලියන්න.
(අ) මෙලෙක (ආ) ලස්සන

(ලකුණු 2x 5 = 10)

05 මෙවර පැවති සමස්ත ලංකා නාට්‍ය තරඟාවලිය සඳහා ඔබ පාසල විසින් ඉදිරිපත් කළ නාට්‍යය ප්‍රථම ස්ථානය ලැබීම පිළිබඳව පුවත්පතකට යොමු කිරීම සඳහා වාර්තාවක් සකස් කරන්න.

**නැතහොත්**

මාරාන්තික ඩෙංගු උවදුර රටපුරා ශීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. ඩෙංගු උවදුරෙන් වැළකීම සඳහා ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට පාදක වූ මූලාශ්‍ර කෘතිය කුමක් ද?
(ආ) එම මූලාශ්‍ර කෘතියෙහි කතුවරයා කවුද?

(ii) 'පන්සිළු වීණා නද පසු ............ බැස් වූ
මන්පිනවන වෙණ නදයෙන් ............ තොස්වූ'
(අ) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) 'පන්සිළු' යනු කවුද?

(iii) (අ) කෝට්ටේ යුගයේ විසූ පැවදි පඬිවරු දෙදෙනෙක් නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගණන කීයද?

(iv) 'ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ ............ කපනූ
බොරැල්ලේ තරම දැනගෙන උඩ ............ පනිනූ'
(අ) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) ඉහත කවිය කුමන ජනකවි වර්ගයට අයත් ද?

(v) ''උඹ මේ ගමේ ඉන්න කවුරු හරි කසාද බැඳ ගනින්.''
(අ) මේ ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙය ශ්‍රවණය කළේ කවුරුන් විසින් ද?

(vi) 'ජාතිය රන් විමනක් ............ වේ
ආගම මිණි පහනක් ............ නේ
එය රැක ගන්නට ............ මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ ............ වේ'
(අ) මෙම පද්‍ය රචකයාගේ වෙනත් නිර්මාණ දෙකක නම් ලියන්න.
(ආ) මෙහි ඇතුළත් රූපකාර්ථවත් යෙදුමක් උපුටා දක්වන්න.

(vii) (අ) 'ගංගාවේ සංගීතය' පද්‍ය නිර්මාණයේ රචකයා කවුද?
(ආ) ඔහු හැඳින්වූ විරුද නාමය කුමක් ද?

(viii) (අ) ඇස්. මහින්ද හිමියන් පද්‍ය රචනා කිරීමේ දී යොදා ගත් තේමාවන් දෙකක් ලියන්න.
(ආ) ජාතික තොටිල්ල පද්‍ය පන්තිය ඉදිරිපත් කරන ලද වෘත්ත කුමක් ද?

(ix) (අ) සිංහබාහු නාට්‍යය ප්‍රථම වතාවට රඟ දැක්වූයේ කොහේ ද?
(ආ) මෙම නාට්‍යය කුමන නාට්‍ය සම්ප්‍රදායට අයත් ද?

(x) (අ) එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නවකතා දෙකක් ලියන්න.
(ආ) එතුමාගේ සිංහබාහු හැර වෙනත් නාට්‍යයක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02 පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ඒ අභිමතාර්ථ සාධක වූ චින්තා මාණික්‍යයක් බඳු වූ මාගේ ස්වාමි දරු වූ බෝධිසත්වයන් වහන්සේ ඒ මල් දඬු මුලින් උදුරුවා ''මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවනට දෙව'' යි තමන් වහන්සේගේ පුරුෂයන්ට දුන්හ.
(අ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?
(ආ) මෙහි සඳහන් උපමාව උපුටා දක්වන්න.

(ii) කැර මිණි බරණ රැස්
රසින් සුරසැවු සුවහස්
සුරන් සහ සහසැස්
නොකර සිටියේ අහස් කුස හිස්
(අ) මෙම පද්‍යයට අනුව වීණා වාදනය ඇසීමට රැස්වූවෝ කවරහු ද?
(ආ) සුරසැවු, සහසැස් යන පදවල අරුත් දක්වන්න.

(iii) ''අඩලා වැඩක් නෑ ළමයා. මං දැන් හොඳට වයස මිනිහෙක්. මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ. මේ හිරගෙට ගිය කෙනෙක් කවදාවත් ආපසු ආවේ නෑ.''
(අ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?
(ආ) මෙහි හිරගෙට නියම වූ තැනැත්තා කවු ද?

(iv) තුමුල ගතින්දා
බාහු බෙලෙන්දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගිජින් දා
කුඹු තල සින් දා
ලමි සේ කෙසරින් දා
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ
(අ) තිදසින්දා, ගජින්දා යන වචනවල තේරුම් ලියන්න.
(ආ) සිංහබාහු මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කාගේ ප්‍රකාශකට පිළිතුරු වශයෙන් ද?

(v) සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි
කවදා කොතැනකදී හෝ මහ මුහුදු හිමි
හමුවුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි
(අ) මෙම පද්‍යයෙහි දැක්වෙන පරිදි තමා සතු බර ලබා දෙන්නේ කවරෙකුට ද?
(ආ) මෙම පද්‍යයෙහි අනුප්‍රාසය දනවන පද පේළි දෙක උපුටා දක්වන්න.

(ලකුණු 4 x 5 = 20)

03 ගුත්තිල කාව්‍ය කතුවරයා තම කාව්‍ය රසවත් කිරීම සඳහා,
(i) ජීවමාන අයුරින් අවස්ථා නිරූපණය කිරීමත්,
(ii) විවිධ විරිත් භාවිත කිරීමත් තුළින් තම ප්‍රතිභාව ප්‍රකට කරයි. එක් කරුණකට නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිළි කරන්න.

<u>නැතහොත්</u>

උම්මග්ග ජාතක කතාව සාර්ථකත්වය සඳහා කතුවරයා යොදාගත්,
- (i) උචිත භාෂාව
(ii) අවස්ථා හා සිද්ධි නිරූපණය හේතු වී ඇත,
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 15)

04 (i) අත්දැකීම් රසවත් ව ඉදිරිපත් කිරීමට භාෂාව යොදා ගැනීම,
(ii) අජීවී පරිසරයට සජීවී බවක් ආරෝපණය කිරීම මඟින් එච්.එම්. කුඩලිගම කවියා ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය සාර්ථකව නිර්මාණය කර ඇත,
උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිළි කරන්න.

<u>නැතහොත්</u>

බැද්දේගම නවකතාව තුළින්,
- (i) පරිසරය බිඳ වැටීම,
(ii) ගම් වැසියන්ගේ පරිහානිය,
මනාව සංකේතවත් කරයි. අදාළ කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15)

- **ප්‍රශ්න අංක 05, 06, 07 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

05 දරු නැළවිල්ල පද්‍ය පන්තිය සඳහා කවියා යොදාගත් කාව්‍ය උපක්‍රම උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් පැහැදිළි කරන්න.

(ලකුණු 10)

06 භාෂා භාවිතයේ දී සරත්චන්ද්‍රයන් දක්වා ඇති දක්ෂතාවය 'ලෙන අතහැර යාම' නාට්‍ය කොටස ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

07 අපූරු ආකාරයට උපදෙස් දෙන්නට ජනකවියා තුළ වූ හැකියාව 'හානා හීය පානා අඬහැරෙන් දූනේ' පද්‍ය පන්තිය තුළින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිළි කරන්න.

(ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (4) | 11 - (4) | 21 - (3) | 31 - (3) |
| 2 - (1) | 12 - (4) | 22 - (4) | 32 - (4) |
| 3 - (2) | 13 - (1) | 23 - (4) | 33 - (1) |
| 4 - (3) | 14 - (4) | 24 - (2) | 34 - (4) |
| 5 - (2) | 15 - (3) | 25 - (2) | 35 - (4) |
| 6 - (1) | 16 - (4) | 26 - (1) | 36 - (2) |
| 7 - (4) | 17 - (2) | 27 - (1) | 37 - (1) |
| 8 - (3) | 18 - (3) | 28 - (4) | 38 - (3) |
| 9 - (4) | 19 - (3) | 29 - (3) | 39 - (1) |
| 10 - (3) | 20 - (2) | 30 - (1) | 40 - (1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(i) (අ)හොඬ, හඬ, අඬනවා (ආ) සජ්ඣායනා, මජ්ඣිම
(ii) (අ)අහස් + එහි (ආ)දරු + ආ
(iii) (අ)ප්‍රතිපත්තියක් (ආ)කළමනාකරණ
(iv) (අ)පැල → පැල් රැකීම යන අදහස (ආ)පැළ → පැළෑටිය
(v) (අ)ආශිර්වාද ක්‍රියා (ආ)මිශ්‍ර ක්‍රියා
(vi) (අ)ජාතික + උත්සව (ආ)සුළු + අඟිල්ල
(vii) (අ)අක්කාගේ මාලේ මුතු ඇට (උපමානය) (ආ)පිනි බින්දු (උපමේය)
(viii) (අ)සේවකයන් විසින් මාර්ගය පිළිසකර කෙරෙයි / කරනු ලබයි.
(ආ) කිරිල්ලියක විසින් පැටවෙක් පෝෂණය කරනු ලැබුවේය.
(ix) (අ)පයින් යන්නන් දකුනෙන් ගමන් කළ යුතුය. / පයින් යන්නෝ දකුණෙන් ගමන් කළ යුත්තෝය.
(ආ) සභා තොමෝ සතුටින් විසින් ගියාය. /
(x) (අ)කෙරෙහි නිපාත (ආ)ඉමහත් උපසර්ග

02 රචනාව වචන 250 කට නො අඩු විය යුතුයි. පහත කරුණු සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.
- මාතෘකාව (නිර්මාණශීලීත්වය)
- සාරවත්භාවය හා නිර්මාණාත්මක භාවය (ලකුණු 08)
- කරුණු (ලකුණු 05)
- ශිල්පීය දක්ෂතාව (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ (ලකුණු 05)

03 සාරාංශකරණය සඳහා ලකුණු 10 කි. අන්තර්ගත කරුණු හා ශිල්පීය දක්ෂතා සලකා බලා ලකුණු ලබා දෙන්න.
- අන්තර්ගත කරුණු (ලකුණු 06)
- වචන ගණන (ලකුණු 02)
- ශිල්පීය දක්ෂතා (ලකුණු 02)

04 1. අන්ධ දරුවෙකු වීම / කණ කොළුවෙකු වීම
2. රැයේ හා දවලේ උණුසුම හැර වෙනත් වෙනසක් තිබේද යන්න. / පාට කියා දෙයක් තිබේද යන්න. / ලස්සන කියන දෙය තමාට නොතේරෙන්නේ ඇයිද යන්න.
3. තම දරුවාට දෑස නොපෙනීම නිසා 4. උණුසුමෙන්
5. i මෙලෙක මෘදු, සිනිඳු ii ලස්සන සුන්දර, අලංකාර

05 කොටස් දෙකෙන් එකකට අදාළව පිළිතුර ලියා තිබිය යුතුය.
- ආකෘතිය (ලකුණු 03)
- අන්තර්ගතය (ලකුණු 07)
- ශිල්පීය දක්ෂතා (ලකුණු 05)

### III කොටස

01 (i) (අ) පාලි ජාතකට්ඨ කතාව (ආ) බුද්ධ ඝෝෂ හිමි
(ii) (අ) නන්දන කැන් දුටුවද බිය සිස් වූ / මින් රළ විත් ගං වෙරළට රුස්වූ
(ආ) පංචශිඛ / ශක්‍රයාගේ වීණා වාදකයා
(iii) (අ) තොටගමුවේ රාහුල හිමි / වැත්තෑවේ හිමි / වීදාගම මහා මෛත්‍රෙය හිමි
(ආ) පද්‍ය 511 කි.
(iv) (අ) කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු / තමුන්ගේ තරම දැනගෙන කල් ගෙවනූ
(ආ) උපදේශාත්මක කවි / දැනමුතුකමට කී කවි / උපදෙස් කවි
(v) (අ) අලුත් ගම්මුලාදෑනි / පුංචිරාළ / වෙදරාළ (ආ) පුංචි මැණිකා / බබුන්ගේ බිරිඳ
(vi) (අ) කව්මිණ, ළමා කවි කළඹ (කව් මුතු), ඔවා මුතු, නන්දන ගීත, නිදහස් දෑහැන, නිදහසේ මන්ත්‍රය, ලංකා මාතා
(ආ) ජාතිය රන් විමන / ආගම මිණි පහන
(vii) (අ) එච්.එම්. කුඩලිගම මහතා (ආ) සිංහල ෂෙලී
(viii) (අ) ළමුන් සඳහා පද්‍ය රචනා / දේශානුරාගී හා ජාතිකානුරාගී රචනා / බුද්ධාභි වන්දනා කවි
(ආ) වසන්ත විරිත
(ix) (අ) පේරාදෙණිය (විශ්ව විද්‍යාල එළිමහන් රංග පීඨය) (ආ) ශෛලිගත නාට්‍ය සම්ප්‍රදාය (නාට්‍යධර්මී)
(x) (අ) මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා, විලාසිනියකගේ ප්‍රේමය, හෙට එච්චර කළුවර නෑ
(ආ) මනමේ, එලොව ගිහින් මෙලොව ආවා, පේමතෝ ජායතී සෝකෝ, පබාවතී

02 (i) (අ) මියුලු නුවරට වතුර නැවැත් වූ අවස්ථාවේ ඊට උපක්‍රමශීලීව මුහුණ දුන් අවස්ථාව
(ආ) 'චින්තා මාණික්‍යයක් බඳු වූ උපමාව
(ii) (අ) සුරන් හා සහසැස් / ශක්‍රයා හා දෙවියන් (ආ) සුරසැවු දේදුනු, සහසැස් ශක්‍රයා
(iii) (අ) පුංචි මැණික බබුන් සොයා හිරගෙට යන අවස්ථාව (ආ) බබුන්
(iv) (අ) නිදසින්දා ශක්‍රයා, ගජින්දා හස්තියා / ඇතා (ආ) සිංහ සීවලී / නැගණිය (සිංහබාහුගේ)
(v) (අ) මහ මුහුදු හිමිට
(ආ) 'සැඟවෙමි එබෙමි, නිසසල වෙමි සසලවෙමි / ඇඹරෙමි එරෙත් පසු නොබසිමි නොනවතිමි''

03, 04, 05, 06, 07 යන ප්‍රශ්න වලට අදාළව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.